Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වාරියපොල ප්‍රාදේශීය සභාව

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දිනැතිව හා අර්ධ ශිල්පීය ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2009.05.12 දිනැතිව අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වසර 03කට වඩා වැඩි කාලයක් ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | සේවක ගණය | ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01. වැඩ/ ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 03 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව<br>PL1 - 2016<br>රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- |
| 02. පුස්තකාල උපස්ථායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව<br>PL1 - 2016<br>රු. 24,250 - 10x250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/- |

01. වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) හා පුස්තකාල උපස්ථායක තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :-

I. අධ්‍යාපන සුදුසුකම් :-
අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයය හැර)

II. බඳවා ගැනීමේ ක්‍රමය :-

මූලික සුදුසුකම් සපුරා ඇති අය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ ප්‍රථිපල මත සුදුසුකම් ලත් අය බඳවා ගනු ලැබේ.

III. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව තෝරාගනු ලැබේ. එම කාලය තුල සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

IV. පොදු කොන්දේසි (සියළුම තනතුරු සඳහා)

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශ්ෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

5. වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරියාගෙන් ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

V. ප්‍රාදේශීය සභාවේ සිථිර සේවයේ නියුතු අයෙක් හෝ අනියම්/ ආදේශක / තාවකාලික සේවයේ යෙදී සිටින අයෙකුට නම් වයස් සීමාව බලනොපාන අතර, ඔහු/ ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලැබීමක් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

VI. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2019.02.08 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, වාරියපොල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල අනුපිටපත් ඇමිණිය යුතුයි :

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. ජාතික හැඳුනුම්පතෙහි පිටපත
4. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය,

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, වාරියපොළ.

2019 ජනවාරි මස 01 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**වාරියපොල ප්‍රාදේශීය සභාවේ ..................................................... තනතුරු සඳහා වූ අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :————————————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————————.

02. පෞද්ගලික ලිපිනය :————————————————.

03. උපන් දිනය :- අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————,

(අ) 2019.01.01 දිනට වයස අවුරුදු :—————, මාස :—————, දින :—————,

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————————.

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :————————————————.

06. ස්ත්‍රී / පුරුෂභාවය :————————————————.

07. විවාහක / අවිවාහක බව :————————————————.

08. සමත්ව ඇති ඉහළම විභාගය :————————————————

09. ශිල්පීය නිපුණතා :————————————————.

10. වෘත්තීය සුදුසුකම් :————————————.

11. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේ ද?:————————————.

12. එසේ නම් දඬුවමේ ස්වභාවය :————————————.

13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍යය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.